රේල් පීලි

ලක්ෂ්මන් කොඩිතුවක්කු

කොන්ක්‍රීට් තරප්පු පෙළ දිගේ මා විදුලි රිය පොළ වෙත ඇදුනේ අඳත් සෝමසේකරන් කළින්ම ඇවිල්ලා ඇතිය යන බලාපොරොත්තුවෙන්. ඊයේ රෑ වැහෙපු වැස්සට වේදිකාවේ තැන්තැන්වල මතුවෙලා තිබුණ දිය කඩිති අහස දිහා බලන් ඉන්නේ අඳත් තදට අව් රැල්ලක් පාපසන් කියන්න වාගේ. බංකුවලත් කිසි-වෙකුත් වාඩිවෙලා නැත්තෙ තවමත් තෙතමනය නිසා වෙන්නැති. උණුසුම පතන කාටත් අඳුරු අහසේ අසුන්දර පෙනුම කියාපසෙව අඳත් වැස්සකට ඉඩ වෙන්කරලා කියන්නා වාගේ. එහෙන් මෙහෙන් ඟිනියට වැඟි බිඳුත් කඩා හැළෙනවා. මා අතේ ඇති මොබිටෙලයෙන් වෙලාව බැලුව. අටට කිව්වුයි. සිඩ්නි නගරයට යන විදුලි රිය එන්න තව මිනිත්තු දොළහක් තියෙනව. මම ගිටපු තැනම නැවතිලා වටපිට බැලුවෙ ඇයි ! තවමත් සෝමසේකර නැත්තෙ කියලා. හැමදාම මටත් කළින් ටූන්ගැබ් විදුලිරියපොළ වෙත ඇවිල්ලා මං එනතුරු බලාසිටින සෝමසේකරන් ඇයි ! අඳ ප්‍රමාද. නේකාකාර ඇඳුම් පැළඳුම් වලින්, ජව්වර්ණාවලින් සමන්විත බහුවාර්ගිකයො පිරුණු වේදිකාව තුළ ඒ පාටවලනි මවා ඇත්තේ කෙතරම් අලංකාර චිත්‍රයක්ද ? මෙවැනි සිතුවම් බොඳ කරලා කීතු කීතු ඉරලා දාන්නෙ ඒ චිත්‍රය සිතුවම් කරන මනුෂ්‍යයොම නේද ? මට එහෙම හිතුනෙ වෙන් වෙන්න හඳපු මිනිස්සු ඉන්න රටක උපන්, තවමත් වෙන්වෙන්න දගලන පදිංචිකාරයො ඉන්න රටක පදිංචි, සෝමත් මාත් එවැනි චිත්‍රයක කොටස්කරුවන් නේද කියලා දැනිලා.

සෝමසේකරන් හා මා දැන් මේ රටේ විප්‍රවාසියො වුනත්, සෝමසේකරන් සමහර අවස්ථාවලදී මට කිව්වෙ ලංකාවෙ ඉන්දැද්දිත් ඔහු විප්‍රවාසියෙක් කියලා. ඒ දවස්වල ඔහු මට ඒක ලංකාවෙදිත් කියලා තියෙනවා. එහෙත් ඔහු එහෙම කිව්වෙ විහිළුවටද ? නැත්නම් ඇත්තටමද ? කියලා මට තේරුම්ගන්න බැරිව තුෂ්ණීම්භූතව ඔහුගෙ මුහුණ දිහා බලාගෙන ඉන්නකොට ඔහු හිනාවෙලා "උඹ හිතන්නෙ උඹ ආදිවාසියෙක්ද ? කියලා අහන එක. අපි හිනාවෙන්ම ඒක අකා මකා දාතවා මිසක් ඒව එච්චර දුරදිගට ගෙනිච්චෙ නැහැ.

සතියෙ දවස් පහක් හයක් රාජකාරියට ගාටන මම හිමිදිරියෙ, කාන්සියට පාළුවට, මිතුරෙකු ලෙස හිටියෙ සෝම විතරයි. සෝමසේකරන්ටත් එහෙමයි. වසර කිහිපයක් පුරා එකට රාජකාරි කරන, එකට විදුලිරියේ ගමන් කරන සෝමසේකරන් උදෑසම දුටුවම මගේ හිතට දැනෙන්නෙ පුදුම සතුටක්. සිංහල, සිංහල, දෙමළ දෙමළ වගේම දෙමළ සිංහල මිනිස්සුත්, වෙන්වෙලා හුදෙකලා වී ඉන්න මේ රටේ සෝමගේත් මගේත් මිතුදමට නොබිඳි ගලායෑම ගැන අප පවුල් දෙකම හිටියෙ දැඩි සතුටකින්.

මා නැවතත් නෙත් කරකවා වටපිට බලනකොටයි දුටුවේ සෝමසේකරන් ඇවිල්ලා එහා පැත්තෙ කොනක හිටගෙන ඉන්න විත්තිය. ඔහු හිටගෙනම පුවත්පතක් කියවමින් ඉන්නවා. "සෝම මාව දකින්න නැතුව ඇති."

"සමහර විට හිතන්න ඇති මම සිත් ලිව් එකක් දාලා ගෙදර කියලා."

මම දෙවිදියකට එහෙම හිතලා පය උස්සලා සෝම-සේකරන් අසළට ඇවිදගෙන ගියා.

"පුදුමයි ඇයි ! ඔහු තවමත් ඉන්නෙ මාව නොදැක්ක ගාතව" මා ඔහු ඉදිරිපිට ගිහිල්ලා හිටගත්තා. "ඉඩි මෝනින් සෝම මොකද ? අද උඹ මාව දැක්කෙ නැද්ද ?...."

මම එහෙම ඇතුවත් ඔහුගෙ මුහුණ කිසිම හිනාවක් නැහැ. පුවත්පතටම මුහුණ ඔබා ගෙන හිටිය ඔහු පිඹුරෙක් වගේ ඇතින් හෙම්හිට ඇදිගෙන එන විදුලිරිය දෙස බැලුවේ මයේ දෙස නොබලමයි. මං හිටි පිළිමයක් වගේ සෝමසේකරස් දිහා බලාගෙන ඉන්නවා. ඊයම් බරවකින් හදවතට ඇන්නාවගේ දැනුන වේදනාව යටපත් කර ගන්න මා බොහෝ උත්සහ ගත්ත. වෙනදට අහන දරු පවුලෙ සුවදුක් විස්තර, ස්කෝල තොරතුරු, අසනීප, බඩු මිල, මෙරටේ දේශපාලන වංචනු ආදී මාතෘකාවලින් පිරිගිය අපේ සබාද මණ්ඩපය අද ගොළු වෙලා. නාඳුනන පිරිසක් පහරදීලු, කඩා බිඳ දමපු ගුවන් විදුලි නාලිකාවක හඬ පිට කළ නොහැකි තිවේදකයො දෙන්නෙක් වගේ අපි දෙන්නා දෙපැත්ත බලාගෙන ඉන්නවා. ඔහු මට පිටුපාලා ගිහිල්ල නවත්වපු විදුලිරියේ වෙනත් මැදිරියකට ගොඩවුණා. මාත් එයටම ඇතුල්වෙන්න උත්සහ කළත්, එයට ඉඩක් නොලැබුණේ කවදාවත් මට මෙහෙම නොකර-පු මේ මිනිහට අද මොකද වුණේ කියන සිතිවිල්ලෙන් සිත මන්දගාමී කළ නිසා. පැයක පමණ ගමනාන්තයක් තිබෙන මේ අවස්ථාවේ අපි දෙන්නට කතා කරන්න කොපමණ දේවල් තිබුණද, තියෙනවද, විදුලි රිය ගැස්සිලා ඉස්සරහට ඇදෙනකොට උදේ පාන්දර කාපු සම්බෝලයි පානුයි උගුරට එන්න වගේ දැනුන. "ටවුන්හෝල්" වලදී විදුලිරියෙන් බැහැපු සෝමසේකරන්, බෑග් එක එක අතකින් එල්ලගෙන කාර්යාලය පැත්තට පියාඹලා ගියේ කුරුල්ලෙක් වගේ. මම කවදාවත් දැකලා නැහැ ඔහු මෙපමණ වේගයෙන් යනව. හිතට දැනෙන වේදනාව දරාගන්න බැහැ. මම දුවල ගිහිල්ල සෝමගෙ අතින් අල්ලගත්ත.

"සෝම උඹට මොකද වෙලා තියෙන්නෙ. මොකක්ද ? මගේ අතින් වෙච්ච වැරැද්ද ? ... සෝම කියපන් උඹට මොකක්හරි අසනීපයක්වත් ද? ..." මගේ අත ගසා දාල ගොඩනැගිල්ල ඇතුළට ගිය ඔහු ලිෆ්ට් එකට ගොඩ වෙලා ඉහළට ඇදිලා ගියා. මට කර කියාගන්න දෙයක් නැහැ ගේ බාල වගේ. ස්වල්ප වේලාවකින් මමත් උඩුමහළට ගොස් කාර්යාලයේ වාඩිවුයේ අතේ ඇති බඳය මේසයේ පැත්තකට විසිකරමින්. සෝමසේකරන් වාඩිවෙලා වැඩ පටන් අරන් ඉන්න රූපය විදුරු කවුළු තුළින් මගේ නෙතට කෙලින්ම පෙනෙනව. ඉදිරියේ ඇති තවමත් පණ නොගැන්වූ කොම්පියුටරයේ අඳුරු මොනිටරය දිහා මම බලාගෙන හිටියෙ හිතට ආ කේන්තිය අපේ කමක් වගේ එකින් මට නැවතත් මැවී පෙනෙන්නෙ අපි දෙදෙනාගේ අතීතය.



සෝමසේකරුනුත්, මාත් දෙන්නම ලංකාවේදී ඉගෙනගන්නත එකම විශ්ව විද්‍යාලයෙය. සෝම යාප-නෙන් පාස්වෙලා ඇවිල්ලා කොළඹ නතර වෙලා ඉගෙන ගත්තෙ. අපි දෙන්නගෙ මිතුදමට තරමක අතීතයක් තියෙන්න ඒ නිසා. සෝමට උපාධිය අවසන් කරන්න ලැබුනෙ නැහැ. කලබල කාලෙ ඔහු ගෙදර ගිහිල්ලා එතව කිව්වට ආපහු ආවෙත් නැහැ. ඊට පස්සෙ මම සෝම ගැන හොයලා බැලුවට රටේ වාතාවරණය අනුව එහෙම දෙයකට තොරතුරු ලබාගන්නට මට එහෙම යන්න පුළුවන් කමක් තිබ්බෙ නැහැ. ආපහු මට සෝම මුණගැහෙන්නෙ මෙහෙදි. ඔහු යාපනේ ඉඳල් මැරපෙරදිග රැකියා-වකට ගිහිල්ලා තියෙන්නෙ ඉන්දියාව හරහා. ඊට පසු ඔහු ලංකාවට ඇවිල්ල මෙරටට ඇවිල්ල තියෙන්නෙ අනාරයෙක් විදියට. ඒ වනවිටත් ඔහුට දරු මල්ලො ඉන්නව. සෝමසේකරන් මට මෙහෙදි මුණගැහුණෙ " ස්කිල්ස් මයිග්‍රන්ට්" කාර්යාලයෙදි. එය රැකියා සොයන්නවුනට මඟ පෙන්වන ආයතනයක්.

සෝමසේකරන් මුලින් දුටු ගමන් මගේ ඇස් ඔහු ළඟ නතර වුණා. ඔහු ටිකක් මහත්වෙලා. ඉත්තෑකුරු කොණ්ඩෙ තරමක් පැහිලා තලතුනා පෙනුමක් සිර-රට ගෙනාදි තිබුණා.

"හෙලෝ ආ යු සෝමසේකරන් " ඔහු දෙබැම හකුළුවා තරමක් වේලා මා දෙස බලා සිටිය.

"සෝමෙ උමට මාව හඳුනන්න පුළුවන් ද ? ..." "උඹ උඹ ජයදේව නේද ? .. "ඔහු එක්වරම සිංහලෙන් කතාකරලා මගේ දෑතින් අල්ලගත්ත.

"කොහොම හඳුනන්නද බං, රැවුල ඉඳිලා, තරිවේ පැඳිලා, නහයෙනුයි ඇස් දෙකෙනුයි මං උඹව හඳුනගත්තෙ" අපි දෙන්න ආගිය තොරතුරු කතා කරලා එම කාර්යාලයෙන් එළියට බැහැලු ලොසරියකට රිංගලා බීම දෙකක් ගත්ත.

"එහෙනම් දැන් උඹයි මායි දෙන්නම එක බෝට්ටුවේ. මං බෝට්ටුවෙන් ඇවිල්ල බෝට්ටුවෙ උඹ උඩින් ඇවිල්ල බෝට්ටුවෙ" එහෙම කියපු සෝමසේකරන් මඟ හඬින් හිනාවුනා.

"උඹ ඉන්නෙ කොහෙද ? ජයේ"

"මං ඉන්නෙ ටුන්හැබි යුනිට් එකක. හම්බකරපුවයින් දැන් යුනිට් එකේ කුලිය ගෙවනව."

"මාත් ඉන්නේ ඒ ළඟමනෙ. මාත් එහෙම තමයි. ඉක්මණට මොනව හරි හොයාගන්න ඕනෙ. මේ දවස්වල ලීෆ්ලට් බෙදල කියක් හරි හොයාගන්නෙ ගමන් වියදම් වලට"

ලංකාවේ යුද්ධය අවසන් වීම පිළිබඳව ඔහුගේ හා මාගේ අදහස් නොගැලපුනත් එම තර්ක විතර්ක සුහවාදිව අවසන් වී අපේ මිතුදම ශක්තිමත් වීම පිළිබඳව මා සිටියේ දැඩි සතුටකිනි.

"එහෙනම් සෝම උඹ වරෙන්. අපේ යුනිට් එකට දරු මල්ලො බලාගෙන තියෙන හැටියට කෑම ටිකක් කාල ගියහැකි"

ඔහුගේ දරුවන් ද මගේ දරුවන්ද ඉගෙනීම ලැබුවේ එකම පාසැලෙනි. අපි ලෙසම සෝමගෙ බිරිඳත්, මාගේ බිරිඳත් සමීප මිතුරියන් වී ළඟින් ආශ්‍රය කළෝය. සෝමගේ බිරිඳ, ශාන්තිනිගේ දෑතින් සාදන කෑමය. ඇය එය නොපිරි-හෙළා ඉවු කළාය. අපි දෙදෙනාගෙන් මුලින්ම රැකියාව ලැබුනේ මටය. සෝමසේකරන් එවිට සිටියේ කොන්ත්‍රාත් පදනම මත වැක්සියක් පදවමින්ය. මගේ උගත්කමට සරිලන රැකියාවක් නොවුවද එය රජයට සම්බන්ධ රැකියාවකි. ඊට පසු එම ආයතනයේ ආ ඇබෑර්තුවකට සෝමසේකරන්ගේ අයදුම්පත යොමු කළේ මමය. එලෙසම මාගේ වැඩ කටයුතු ගැන හිතට අවැල්ලු ආයතන ප්‍රධානියාට සෝමසේකරන් පිළිබඳව යහපත් රෙකමදරුවක් දුන්නේ මාය. එතැන් පටන් අපේ මිතුරුදම තව තවත් දැඩි විය. සහෝදර බැඳීමක් සේම ළං විය.

"ආ යු ඕල්රයිට් ජයා යු තින්කින් ටු මව් ටුඩේ"

මා හිනැස්සි එදෙස බැලුවේ ඒ සිතුවිලි දැහැන බිඳිමින්ය. අප ආයතනයේ අප සමග සේවය කරන ඕස්ට්‍රේලියානු ජාතික ෆ්රැන්ක් මා අසළ සිටගෙන සිටී. මීට පෙර ඔහු සෝමසේකරන් අසළ සිටිනවා මම දුටුමි.

"ආ යු වොච්ඩ් කිලිං ෆිල්ඩ් ඩොකියුමන්ටරි"

මම අහක බලා ගතිමි. ඔහු මහ හඬින් සිනාසෙමින් තවත් මොනවදෝ මුමුණයි. සිඳුවී ඇති දෙය මට තරමක් පැහැදිලිය. සෝමසේකරන් මා හා අමනාප වන්නට හේතුව මෙයමද? මම ඔහු නැවත මුණගැසී කතා කරන තුරු ඉස්පාසුවක් නැත. ඔහු මෙතරම් බොළඳ වුයේ කෙසේද? දහවල් කෑම පැයේදී සෝම-සේකරන් තනිවම ආහාර අනුභව කරන අයුරු දුටු මා ඔහු අසළට ළංවුණා. ඒ අසළ කිසිවෙකුත් නැත.

"සෝම මං දන්නවා උඹ මගෙත් එක්ක තරහවෙන්න හේතුව. මේ අහපන් සෝම උඹයි මායි කාලයක් ඈත්කළේ මේ යුද්දය. අන්තිමට මෙහෙදි අපි ආයෙත් මුණ ගැහුණේ ඒ යුද්දෙම නිසා. සුද්දො අපිව හැමදෑම කෙටෙව්ව සෝම. උන් එදා අපේ රටවල් වලට රිංගල ඒක කළා. අද උන්ගෙ රටවල් වල ඉඳලා දියුණු තාක්ෂණය යොදාගෙන ඒක කරනව. අපිට ගන මරා ගන්න ආයුධ වික්කෙ උං. අපි වගේ එකමුතුකමක් නැති එවුන් තමයි උන්ගෙ රේස්ට් එක සෝම."

නෝසෙ, උළුවඩේ වල සුවඳින් අපේ හිවස රසවත් විය. මගේ බිරිඳ සාදන කිරිබත්, අළුවා, මාළු ඇඹුල් තියල් ආදි ආහාර වලින් සෑම සති අන්තයේම වාගේ සෝමසේකරන්ගේ හිවස සුවඳවත් විය. මගේ බිරිඳගේ දෙවන දරු ප්‍රසූතියේදී ඇය අසළ සිටියේ සෝමසේකරන්ගේ බිරිඳය. දරුවා කුසට ආ දිනයේ සිටම වාගේ ඇයට කන්නට ආස හිතුනේම ශාන්තිනිගේ දෑතින් සාදන කෑමය. ඇය එය නොපිරි-හෙළා ඉවු කළාය. අපි දෙදෙනාගෙන් මුලින්ම රැකියාව ලැබුනේ මටය. සෝමසේකරන් එවිට සිටියේ කොන්ත්‍රාත් පදනම මත වැක්සියක් පදවමින්ය. මගේ උගත්කමට සරිලන රැකියාවක් නොවුවද එය රජයට සම්බන්ධ රැකියාවකි. ඊට පසු එම ආයතනයේ ආ ඇබෑර්තුවකට සෝමසේකරන්ගේ අයදුම්පත යොමු කළේ මමය. එලෙසම මාගේ වැඩ කටයුතු ගැන හිතට අවැල්ලු ආයතන ප්‍රධානියාට සෝමසේකරන් පිළිබඳව යහපත් රෙකමදරුවක් දුන්නේ මාය. එතැන් පටන් අපේ මිතුරුදම තව තවත් දැඩි විය. සහෝදර බැඳීමක් සේම ළං විය.

කෙටි කතාව

කිසිවක් නොකිය කෑම පාර්සලය දිහා බලන් හිටිය ඔහු එතවරම ගිස ඔසවා මා දෙස බැලුව.

"උඹ කියන්නෙ ඒක බොරුවක්ද ? ලේ පොම්ප කරන හදවතක් තියෙන මිනිහෙකුට ඒක බලන් ඉන්න පුළුවන්ද ?

"ඒක ඇත්තක් වුනත් බොරුවක් වුනත් දැන් වෙලා ඉවරයි, සෝම. දැන් අපිට තියෙන්නෙ ඒව ඔක්කොම අමතක කරල අනාගතයට මුහුණ දෙන්න." ඔහු නැවතත් මා දිහා බලා වාපස් සිනහවක් පෑව. බාගෙට කාපු කෑම පාර්සලය දෑතින් ගුලිකර කුණු බක්කියට විසිකළා.

"එහෙනං ඒක නිසා වෙන්නැති ඒකට විරුද්ධව සිටි එකේ පෙළපාලියෙ හිටියෙ"

මා අන්දමන්ද වී ඔහු දෙස බලාගෙන හිටිය ඔහු පුටුවෙන් නැගිටිමට මගෙන් කිසිදු පිළිතුරක් බලාපොරොත්තුවෙන් නොවෙයි.

"ඒ වගෙ තිරිසන් අපරාධ බොරුයි කියල කියන එවුන් තවදුරටත් මගේ මිතුරො නෙමෙයි. උඹත් ඒව අනුමත කරනව."

"මං ගියේ නැහැ සෝම මං එතැන්ට ගිහිල්ල බලන් හිටිය මොකක්ද වෙන්නෙ කියල"

"එහෙනම් ඒක වෙන්නැති ශාන්තිනී කිව්වෙ හවස පෙන්නපු ඒබීසී නිව්ස් වල ඒ පෙළපාළියෙ උඹත් හිටිය කියල. හිකත් බොරු කියන්න එපා ජයේ." හැම සිංහලයම ජාතිවාදියා. උඹත් එහෙම මිනිහෙක්. බොරුවට වෙස් මුහුණක් දාගෙන."

"උඹත් එහෙම මිනිහෙක් නිසා තමයි අපේ යාළුකම විනාශකරන්න දගලන්නෙ. සෝම මේ අහපං. සිංහලයො සිංහලයො මැරුවෙ නැද්ද ? දෙමළ දෙමළ මිනිස්සු මැරුවෙ නැද්ද ? බල තෑස්ණාව කියන දේ ජාතියට වැඩිය ඉහළයි මිනිහො. බලය ඇති මිනිහ බලය රැකගන්න තමන්ගෙ ජාතිය වුනත් විනාශ කරනව."

"ඒ වුනත් උඹ මට පෙන්නන්නෙ බොරු මුහුණක්. උඹල ඔක්කොම එකයි. සිංහල මිනිස්සුත් එක්ක බැලුවම ලොකු කළකිරීමක් මට තියෙන්නෙ. උඹත් ඒකෙ කොටසක්." එහෙම කියපු සෝමසේකරන් පුටුවෙන් නැගිටල යන්න ගියා.

එදා දවස රාජකාරි කිරීමට මට සිත දුන්නේ නැහැ. කෑම පැයෙන් පසු මගේ මේසයට ගිය මා අතවශ්‍යම වැඩ කොටස නිමා කර කෙටි හිවාවුවක් අයදුම් කළා. අඳින් පසු මාත් සෝමත් ආගන්තුක මිනිසුන් ලෙස රාජකාරියට එන අයුරු මට මැවී පෙනෙනව. වේලාසනින් විදුලි රියපොළ වෙත ගිය නිසා වැඩි සෙනඟක් එහි නැහැ. ටවුන්හෝල් හරහා සිඩ්නි නගරය යටින් දිවෙන විදුලිරියේ උඩ පරිපථ ගැටී වරිත්වර මැවෙන ගිනි පුළිඟු අන්ධකාරෙට හොඳට පෙනෙනව. ඒව මගේ පපුවට වැදෙන්න වාගේ මට දැනෙන්නෙ. ඈතට ඇදී යන රේල් පීලි එකට එකතුවෙලා වගේ පෙනුනට ළං වෙනකොට ඒව වෙන්වෙලා, පීලි දෙකක්. ඒක එක පිල්ලක් වෙලා විදුලිරියට ඒක උඩ යන්න පුළුවන්නම්. මම එහෙම හිනාගෙනම වාඩිවෙලා හිටපු ආසනේ පැත්තකට ඇලවෙලා ඇස් පියා ගත්ත.

යුනිට් එකේ තරප්පු පෙළ නැගල උඩට යනකොටම බිරිඳ දොර ඇරියා. "මොකද ? ජයේ අද කළින්ම" මම මුකුත් නොකිය බෑග් එක මේසය උඩ තිබ්බ.

"අද හරි වැඩේනෙ වුණේ. ශාන්තිනී මගෙත් එක්ක කතා නොකරම අහක බලන් ගියානෙ"

"ඉතින් ඔයා ගිහිල්ල කතා කළේ නැද්ද?"

"මොන" ගෑනි ගස්සගෙන ගියා. අපි මොන වැරදක් කළාද ?"

මම සෝපාවේ වාඩිවෙලා ඇඟ දිගේ ගලායන දහදිය බිඳුවලට පත්තර කෑල්ලක් අරන් පවන් සැලුව.

"තාත්තෙ අද සෝම අන්කල්ගෙ පුතා චන්දත් මගෙත් එක්ක කතා කළේ නැහැ අපෙත් එක්ක ඒ ගොල්ලො තරහවෙලා" මා අසලට ආ දියණිය මට තුරුළු වුණා.

"ඒ ගොල්ලො තරහවෙලා තියෙන්නෙ ඇයි ! තාත්තෙ"

"මං දන්නෑ දුව. දුව කතාකරන්නකො එතකොට ඒගොල්ලො කතාකරයි"

"ඒ ගොල්ලො කතා කරන්නෙම නැහැ තාත්තෙ ඇත්තටම තරහවෙලා. ඒ ගොල්ලො ආයි අපිත් එක්ක යාළුවෙයිද තාත්තෙ ....."

"යාළුවෙයි" මම එසේ කිව්වේ දියණිය සනසන්නටය. "කවදද?"

මම නිරුත්තරව දියණියගේ මුහුණ දෙස බලා සිටියෙමි.